## කොටස් තැරැව්කාර ආයතනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව නිරන්තර විමසිල්ලෙන්

කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොටස් තැරැව්කාර සමාගම්වල මූල්‍ය තත්ත්වය පිළිබඳව සොයා බැලීමක් සිදු කරනු ලබයි. උදාහරණයක් වශයෙන් ගත්විට කොටස් තැරැව්කාර ආයතනයක් සෑම මාසයක් අවසානයේම මූල්‍ය වාර්තාවක් දෙන ලද ආකෘතියට අනුව සකසා අදාළ මාසයේ අවසානයේ සිට දින 20 ක් ඇතුළත කොටස් වෙළෙඳපොළ සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට භාරදිය යුතුය.

තැරැව්කාර ආයතනයක් කටයුතු කරන ආකාරය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව විසින් සොයා බැලීම හරහා ආයෝජනයේ නිරත පුද්ගලයන්ට කොටස් වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳ විශ්වාසය ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබේ.

## තොරතුරු දැනගැනීමේ අයිතිය

දැනුවත් ආයෝජන තීරණ ගැනීම සඳහා වැදගත් වන්නා වූ කොටස් තැරැව්කාර සමාගම් සතු සමහර කරුණු පිළිබඳව සොයා බැලීමට මෙන්ම පරිහරණය කිරීමට ආයෝජක ඔබට අයිතියක් ඇත. උදාහරණයක් ලෙස යම් කොටස් තැරැව්කාර ආයතනයක් තම මූල්‍ය වර්ෂය අවසාන වී මාස 4 ක් තුළ විගණනය කරන ලද මූල්‍ය වාර්තා කොළඹ කොටස් හුවමාරුව වෙත භාරදිය යුතුය. එමෙන්ම මෙහිදී සිතෙහි තබාගත යුතු වැදගත් කරුණක් වන්නේ තම සමාගමෙහි ගනුදෙනුකරුවෙකු විසින් යම් ඉල්ලීමක් කළ අවස්ථාවක ඕනෑම තැරැව්කාර සමාගමක් තම විගණනය කළ මූල්‍ය වාර්තා ලබාදීමට බැඳී සිටින බවයි.


SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

28 සහ 29 මහළ, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 01.

දුරකථන: +94 11 2143843

ෆැක්ස්: +94 11 2439149

ඊ-මේල්: mail@sec.gov.lk

www.sec.gov.lk/ www.cmetsec.gov.lk


# ආයෝජකයා, ආයෝජන උපදේශකවරයා සහ කොටස් තැරැව්කාර සමාගම



SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

## ඔබ කොටස් වෙළෙඳපොළ ආයෝජකයකු නම්,

අනාගතයේදී යම් ප්‍රතිලාභයක් ලැබීමේ චේතනාව ඇතිව තමන් මහන්සියෙන් උපයාගත් ධනයෙන් යම් ප්‍රතිශතයක් කිසියම් වත්කමක ආයෝජනය කිරීම ආයෝජකයෙකුගේ අරමුණයි. ආයෝජකයෙකු තම මුදල් එවැනි කටයුතු සඳහා වෙන් කිරීමේදී තමන් ගනුදෙනු කරනු ලබන ආයතනය පිළිබඳව ඉතා හොඳින් සොයා බලා ගනුදෙනු ආරම්භ කිරීම සහ ගනුදෙනු ආරම්භ කර ඉදිරියට යාමේදී විමසිලිමත්ව ආයෝජනයෙහි නිරතවීම ඉතා වැදගත් වේ. ඒ අනුව ගත් විට කොටස් වෙළෙඳපොළ ආයෝජනයේදීද ආයෝජකයෙකුට මුලින්ම මුණගැසෙන ආයතනය කොටස් තැරැව්කාර සමාගමයි. එමෙන්ම එහි ගනුදෙනු සඳහා ආයෝජකයාට පහසුකම් සලසනු ලබන්නේ කොටස් තැරැව්කාර සමාගමේ සිටින ලියාපදිංචි ආයෝජන උපදේශකවරයන්ය. මේ අනුව ආයෝජකයෙකු ආයෝජන උපදේශකවරයා සහ කොටස් තැරැව්කාර ආයතනය සපහනු ලබන සේවාවන් මොනවාද යන්න සොයා බැලීමක් කරනවා සේම ආයෝජන උපදේශකවරයා කුමන ආකාරයේ පුද්ගලයෙක්ද ඔහු අදාළ සුදුසුකම් සපුරා ඇත්ද සහ කොටස් තැරැව්කාර ආයතනයේ ස්වභාවය, එහි පැවැත්ම සහ මූල්‍ය තත්ත්වය ආදී කරුණු පිළිබඳවත් සොයා බැලීමක් කළ යුතුය.

## කොටස් තැරැව්කාර ආයතනය පිළිබඳව ඔබ කොතරම් දැනුවත්ද?

ඔබගේ කොටස් වෙළෙඳපොළ ආයෝජන ගමන් මගේදී කොටස් තැරැව්කාර ආයතනයක් විසින් සපයනු ලබන්නේ ප්‍රබල කාර්යභාරයකි. එමෙන්ම ආයෝජන තීරණ ගැනීමේදී කොටස් තැරැව්කාර ආයතනයක් මගින් අවශ්‍ය සියළු විස්තර අසා දැනගැනීම තුළින් සමහර අවස්ථාවල ඔබට අනාගතයේදී මුහුණ දීමට සිදුවිය හැකි විවිධ ගැටළු වලින් ආරක්ෂා වීමට උපකාරී වේ. කොටස් තැරැව්කාර ආයතනයක් සමග ගනුදෙනු කිරීමේදී ආයෝජකයෙකු වශයෙන් අවධානය යොමු කළ යුතු සහ හොඳින් දැනුවත්ව සිටිය යුතු වැදගත් කරුණු රාශියක් දැකගත හැකිය.

ආයෝජකයාට කොටස් තැරැව්කාර ආයතනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව තීරණය කිරීමට පහසුවක් මෙම මූල්‍ය වාර්තා මගින් ලබාදෙයි. බොහෝ අවස්ථාවල දක්නට ලැබෙන විශේෂත්වයක් වන්නේ ආයෝජකයෙකු කොටස් තැරැව්කාර ආයතනයක් තෝරා ගැනීමේදී හෝ අඛණ්ඩව එවැනි ආයතනයක් සමග කටයුතු කරගෙන යාමේදී එම ආයතන වල මූල්‍ය තත්ත්වය පිළිබඳව තොරතුරු විමසීම ඉතා කලාතුරකින් සිදුවන දෙයක් වීමයි. බුද්ධිමත්ව ආයෝජනය කරන්නෙකු මේ සියළු කරුණු පිළිබඳව අවධානය යොමු කරනු ලබයි.

## කොටස් තැරැව්කාර ආයතනයක් තෝරා ගැනීමට පෙර



එම ආයතනය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ කොළඹ කොටස් හුවමාරුවේ නීතිරීති සහ විධාන වලට අනුකූලව කටයුතු කර ඇත්දැයි විමසා බැලිය යුතු වේ. උදාහරණයක් ලෙස කොටස් තැරැව්කාර ආයතනයක් අවම ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වාගෙන නොගියහොත් එම කොටස් තැරැව්කාර ආයතනයේ ගනුදෙනු අත්හිටුවීම දැක්විය හැකිය. එවැනි තොරතුරු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ කොළඹ කොටස් හුවමාරුවේ වෙබ් අඩවිය තුළින්ද දැකගත හැකි වේ.

## ආයෝජනයන් සඳහා ගනුදෙනුකරුවන්ගෙන් ලැබෙන මුදල් පවත්වා ගැනීම විශ්වාසවන්තව සිදු කළ යුතුය

ආයෝජකයන් විසින් කොටස් මිලදී ගැනීම සඳහා ලබාදෙන මුදල් තැන්පත් කිරීමට කොටස් තැරැව්කාර ආයතනයක් විසින් වාණිජ බැංකුවක වෙනම ගිණුමක් පවත්වාගෙන යා යුතුවේ. එසේ ආයෝජකයන් විසින් කොටස් තැරැව්කාර සමාගම වෙත ලබාදෙන මුදල් ඉතා විශ්වාසවන්ත අයුරින් පවත්වා ගැනීමට කොටස් තැරැව්කාර ආයතනය සමත්විය යුතුය. කිසිම අවස්ථාවක එම අරමුදල් කොටස් තැරැව්කාර සමාගමකට තම ප්‍රයෝජනය සඳහා හෝ එහි ණය මුදලක් පියවීම වැනි කාර්යයන් සඳහා යොදා ගත නොහැක. ආයෝජකයෙකු කොටස් මිලදී ගැනීමක් වෙනුවෙන් මුදල් යොමු කරනු ලබන්නේ එම බැංකු ගිණුමට වන අතර එසේ මුදල් තැන්පත් කළ පසු ආයෝජකයා එහි ෆැක්ස් පතක් තැරැව්කාර ආයතනයට යැවීමද කළ යුතුය.

## ආයෝජකයන් වෙතින් ලැබෙන මුදල් ආයෝජනය කිරීම

තැරැව්කාර ආයතනයකට ආයෝජකයින් වෙතින් ලැබෙන මුදල් ආයෝජකයාගේ කැමැත්ත අනුව ඔහු යෝජනා කරන සුරැකුම්පත් මිලදී ගැනීම වෙනුවෙන් වැය කළ හැකිය. ඒ අනුව කොටස්, සමාගම් ණයකර, රජයේ සුරැකුම්, ඒකකභාර ආදී ආයෝජන සඳහා එම මුදල් යෙදවිය හැකිය. ඒ අනුව ආයෝජකයෙකු කොටස් මිලදී ගන්නේ නම් අදාළ සමාගම, කොටස් ප්‍රමාණයන් සහ කොටස් මිලදී ගැනීමට අපේක්ෂා කරන මිල ආදිය ආයෝජන උපදේශකවරයන් වෙත ලබාදිය යුතුවේ. එසේ මිලදී ගැනීමක් සිදු කළේ නම් ඒ සඳහා ගැණුම් සටහනක්ද ආයෝජකයා වෙත ලබාදී සහ එම මිලදී ගැනීම් වලට අදාළ විස්තර තම කොටස් තැරැව්කාර ආයතනය තුළ නිවැරදිව පවත්වාගෙන යාමද වැදගත් වේ. යම් අවස්ථාවක අවශ්‍ය වුවහොත් එවැනි ගනුදෙනු විස්තර කොටස් තැරැව්කාර සමාගම ඉදිරිපත් කිරීමට බැඳී සිටී.

## තොරතුරු වාර්තාකරණ ක්‍රමයක් පවත්වා ගැනීම

ගනුදෙනුකරුවන් සිදු කරන ගනුදෙනු ක්‍රියාකාරකම් පිළිබඳව තොරතුරු වාර්තා කිරීමේ ක්‍රමයක් පවත්වා ගැනීම කොටස් තැරැව්කාර සමාගමක තවත් වගකීමකි. විශේෂයෙන්ම කොටස් මිලදී ගැනීම් සඳහා වන ගැණුම් සටහන් මෙන්ම, කොටස් විකිණීම් සඳහා වන විකුණුම් සටහන් ආදිය ගනුදෙනු ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු වලට ඇතුළත් වේ. ගනුදෙනු හා සම්බන්ධ තොරතුරු නිසි ලෙස පවත්වා ගැනීම තුළින් ආයෝජකයින් විසින් සමාගම වෙත ගෙවීමට ඇති හිඟයන් පිළිබඳව දැන ගැනීමටත්, ගනුදෙනුවක් හා සම්බන්ධ ආයෝජකයෙකුගෙන් යම් පැමිණිල්ලක් ලැබුණහොත් ඒ පිළිබඳව සොයා බලා එය නිවැරදිකර ගැනීමටත් හැකියාව ලැබේ. මේ අනුව නිසි තොරතුරු වාර්තාකරණ ක්‍රමයක් පවත්වා ගැනීම තුළින් කොටස් ගනුදෙනුවලදී මුහුණදීමට සිදුවන ගැටළුකාරී තත්ත්වයන් අවම කර ගැනීමට මෙන්ම ආයෝජක විශ්වසනීයත්වය ඉහළ නංවා ගැනීමටද හැකියාව ලැබෙනු ඇත.

## ස්වයංක්‍රීය වෙළෙඳ ක්‍රමය හා ඇණවුම් ගැළපීම

සමහර ආයෝජකයින්ට කොටස් මිලදී ගැනීම සඳහා ආයෝජන උපදේශකවරයා හරහා භාර දීමෙන් පසු කුමක් සිදුවන්නේද යන්න පිළිබඳව නිසි අවබෝධයක් නෙමැත. වර්තමානයේදී කොළඹ කොටස් හුවමාරුව තුළ කොටස් ගනුදෙනු සිදුවන්නේ ස්වයංක්‍රීය වෙළෙඳ ක්‍රමය (Automated Trading System – ATS) නමැති විද්‍යුත් ගනුදෙනු ක්‍රමයක් හරහාය. එසේම ඇණවුම් ගැළපීම සිදුවනුයේ මිල-කාල ප්‍රමුඛතාව නමැති කොන්දේසිය යටතේය. ඒ අනුව යම් ගැණුම් ඇණවුමකට සමාන විකුණුම් ඇණවුමක් ස්වයංක්‍රීය වෙළෙඳ ක්‍රමය වෙත ලැබුණු විගස එම ඇණවුම් එකිනෙක ගැළපෙන අතර එය සාර්ථක ගනුදෙනුවක් ලෙස පෙන්වා දිය හැකිය.

## දිවයිනේ ඕනෑම තැනක සිට ගනුදෙනු කිරීමේ හැකියාව

කොළඹ කොටස් හුවමාරුවේ ස්වයංක්‍රීය වෙළෙඳ ක්‍රමය හරහා එහි සියළු සාමාජික කොටස් තැරැව්කාර සමාගම් සමග දිවයිනේ ඕනෑම තැනක සිට ගනුදෙනු කිරීමේ හැකියාව ලැබී තිබේ. කොළඹින් බැහැර අයෙකුට වුවද කොටස් වෙළෙඳපොළ සමග පහසුවෙන් ගනුදෙනු කිරීමේ හැකියාව ලැබී ඇත්තේ විද්‍යුත් ගනුදෙනු ක්‍රමය හේතුවෙනි. ඒ අනුව යාපනය, මහනුවර, අනුරාධපුර, කුරුණෑගල, හම්බන්තොට, රත්නපුර ආදී දිවයිනේ ඕනෑම නගරයක ජීවත්වන පුද්ගලයෙකුට ඒ ප්‍රදේශයට ආසන්න කොටස් තැරැව්කාර ආයතනයකට පිවිස තම කොටස් ගිණුමෙහි ඇති විස්තර මෙන්ම කොටස් වෙළෙඳපොළ දත්ත ලබාගැනීමට හැකියාව ඇත.

එපමණක් නොව, වර්තමානය වන විට අන්තර්ජාලය හරහා තම නිවසේ සිටම හෝ තම ජංගම දුරකථනයෙන් වුවද කොටස් ගනුදෙනු කිරීමේ හැකියාවද ඇත. මෙහිදී ඔබ මතක තබාගත යුතු කරුණක් වන්නේ ස්වයංක්‍රීය වෙළෙඳ ක්‍රමය හා අන්තර්ජාලය හරහා ගනුදෙනු කිරීම යනු එකක් නොව, එකිනෙකට වෙනස් සේවාවන් දෙකක් බවයි. කෙසේ වෙතත් මෙහිදී මතක තබාගත යුතු කරුණක් වනුයේ ඔබ අන්තර්ජාලය හරහා ගනුදෙනු සිදු කළත් එය සිදු කළ යුත්තේ කොටස් තැරැව්කාර ආයතනයක් හරහා බවය. දිවයිනේ ඕනෑම තැනක සිට කොටස් මිලදී ගැනීම සහ විකිණීම සඳහා ආයෝජකයින් ලබාදෙන ඇණවුම් නිවැරදිව පරිගණකයට ඇතුළත් කිරීමට ආයෝජන උපදේශකයින් සැළකිලිමත් විය යුතු අතර, ආයෝජකයින්ද නිවැරදිව තම ඇණවුම් විස්තර ලබාදීමට කටයුතු කළ යුතුය.



## අනුකූලතා නිලධාරී සහ ගනුදෙනුකරුවන්ගේ ආයෝජන

කොටස් ගනුදෙනු වලදී ආයෝජකයා තම සියළුම ගනුදෙනු කටයුතු ආයෝජන උපදේශකවරයා සමග කළ යුතු වේ. එමෙන්ම කොටස් තැරැව්කාර ආයතනයක සිටින අනුකූලතා නිලධාරීවරයා (Compliance Officer) කවුරුන්ද යන්න ආයෝජකයෙකු අනිවාර්යයෙන් දැන සිටිය යුතුය. ඔහුගේ ප්‍රධාන කාර්යය වනුයේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව, මධ්‍යම තැන්පතු ක්‍රමය ආදී ආයතනවල නීතිරීති අනුව කොටස් ගනුදෙනු සිදුවෙනවාද යන්න පිළිබඳව සහතික වීමයි.

එසේම අනුකූලතා නිලධාරීවරයා ගනුදෙනු මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ස්වාධීන විය යුතුය. ඒ අනුව කොටස් ගනුදෙනුවක් හා සම්බන්ධ ආයෝජන උපදේශකවරයා හෝ තැරැව්කාර සමාගමේ වෙනත් නිලධාරීවරයෙක් සමග ගැටළුවක් මතුවූ විට ඒ සම්බන්ධ පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය නම් ලිඛිතව මාස තුනක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය. එසේ පැමිණිල්ලක් ලැබුණු පසුව ඊට නිසි සහ සෑහීමකට පත්විය හැකි විසඳුමක් ලබාදීම අනුකූලතා නිලධාරීවරයෙකුගෙන් බලාපොරොත්තු වේ.

මේ අනුව ඉහළ ප්‍රතිලාභ සහිත ආයෝජන කළඹක් පවත්වාගෙන යාමේදී ආයෝජකයකුට මෙම කරුණු සියල්ලම වැදගත් වන බව කිව හැකිය. එමෙන්ම දැනුවත් ආයෝජන තීරණ ගැනීම යන කාරණාවට මේ සියළු කරුණු ඇතුළත් වේ. අවසාන වශයෙන් කිව හැක්කේ කොටස් වෙළෙඳපොළ ඇතුළුව සමස්ත ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ගනුදෙනු කරන ආයෝජකයන්, තමන් ගනුදෙනු කරන කොටස් තැරැව්කාර සමාගම එහි ආයෝජන උපදේශකයන් පිළිබඳව මෙන්ම එම ආයතනය සහ පුද්ගලයන් පිළිබඳ යම් යම් අභ්‍යන්තර කරුණු පිළිබඳව යම් මට්ටමක හෝ දැනුවත් වීමක් සහිතව ආයෝජනය කිරීම සෑම අතින්ම වැදගත් බවයි.